# මානව සංහතියේ ඒකත්වය පිළිබඳ බෞද්ධ විවරණයෙන් පුද්ගල සහජීවනය හා සාමයික ප්‍රතිපදාව ඇගයීමට ලක්වේ ද? විමර්ශනාත්මක අධ්‍යයනයක්

කටුවන සන්තින්‍රිය හිමි[1]

මේ අධ්‍යයනය සහජීවනය, සාමයික ප්‍රතිපදාව මෙන් ම මානව සංහතියේ ඒකත්වය පිළිබඳ ව කෙරුණු බුද්ධ දේශනා, ජාතීන් අතර සංහිඳියාව ඇති කරගැනීමට ඉවහල් කරගන්නා ආකාරය පිළිබඳ විමර්ශනයකි. වර්ගවාදී අදහස්වලින් හා විවිධ භේද නිසා ගොඩනගාගත් සංකල්ප, මානය හා හීනමානය සහිත මානසික බැමි බිඳ, මිනිසා අතර අන්‍යෝන්‍ය අවබෝධයෙන් ජීවත්වීමට බෞද්ධ දර්ශනය උපයෝගී කරගැනීම පිණිස සැඟවුණු බුද්ධ දේශනා ගෙන හැරපෑම මේ පර්යේෂණයේ අරමුණ යි. බුද්ධ කාලීන බමුණු අධිපතිවාදී සමාජවලත් ඉන් පසුත් වර්තමානයේත් අතිවිශාල පිරිසක් මේ බෙදීම් නිසා පීඩා විඳිති. එය දේශපාලනික, ආර්ථික, සාමාජික, ආගමික හා අධිකරණ ආදි හැම අතින් ම, පහත් යැ යි සම්මත කරගත් පිරිසට සමාන අවස්ථා නොදීමෙන් පෙන්නුම් කෙරෙන අතර ඒ පිළිබඳ ව බුදුන් වහන්සේගේ විවේචනාත්මක අදහස් සූත්‍ර දේශනාවල දක්නට ලැබේ. මානව වර්ගයාගේ ඒකත්වය අවධාරණය කරන බෞද්ධ ස්ථාවරයෙන් සාමයික හා සහජීවන ප්‍රතිපදාව මොනොවට විග්‍රහ වන අතර ඒ පැතිකඩ අදාළ පුළුල් විශ්ලේෂණ අස්සලායන සූත්‍රය, වාසෙට්ඨ සූත්‍රය, මධුර සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, වසල සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය හා අම්බට්ඨසූත්‍රය ආදියෙන් පෙනේ. උපත, පරපුර, ධනය සහ බලය දෙස බලා පුද්ගල වර්ගීකරණය නො කරන බුදු දහම ද පුද්ගල ආධ්‍යාත්මික තත්ත්වයන් සලකා පුද්ගල වර්ගීකරණය සිදු කර තිබේ. ඒ බවට සෝවාන් මඟ යන පුද්ගලයාගෙන් පටන් ගෙන අරහත් ඵලයට පැමිණි තැනැත්තා දක්වා දිවෙන ආර්ය පුද්ගලයන් අට දෙනා නිදසුන් ය. පාපතරයා, සිල්වත් පුහුදුන් පුද්ගලයා, සෝවාන් තැනැත්තා, රහතන් වහන්සේ යන සියල්ලන්ගේ අධ්‍යාත්මික අවශ්‍යතා සහ ජීවන දෘෂ්ටිය වෙනස් වුව ද ඔවුහු මිනිස්සු ය. භෞතික නානත්වය නො ව අධ්‍යාත්මික නානත්වය පෙන්වන බුදු දහම භේදයකින් තොර ව මිනිසාට අධ්‍යාත්මික සංවර්ධනයේ පාරප්‍රාප්තිය වන විමුක්තියට ළඟා වීමට මඟ පෙන්වයි. පාපතරයාට වුව ද ජීවන මඟ වෙනස් කර දැඩි වීර්යයෙන් විමුක්තිය සලසාගත හැකි ය. එය මිනිසත් බවේ විශේෂත්වය යි. බඹයක් පමණ වූ කයෙහි ම පුද්ගල අගය හා අධමකම් තීරණය වේ. එය තේරුම් ගෙන අවබෝධයෙන් සමස්ත මානවයා ජීවත් විය යුතු බවත් ජීවන කාලය කෙටි බවත් පෙන්වාදීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පදඃ** මානව සංහතියේ ඒකත්වය, පුද්ගල සහජීවනය, සාමයික ප්‍රතිපදාව, විමුක්තිය

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය